# එතෙර ගිය පොඩි දුවට

- දයාසේන ගුණසිංහ -

‘අපේ රටේ දරුවන් සිවු දෙනෙකුට ස්වීඩනයේ මව්පිය ස්නේහය ලැබීමේ වාසනාව උදා වී තිබේ.’

- පුවත්පත් වාර්තාවක් -

වැහැරී ගිය උකුළේ නැත
සුව යහනක් සැදුණේ
වියළී ගිය දෙතනේ නැත
කිරි බිඳුවක් චිරුණේ
කප පවතින තුරු නො නිමෙන
සුසුමෙන් සමු ගැනුණේ
හිරු ගිලිහෙන මොහොතක නුඹ
මඟ අයිනක රැඳුණේ

උපන් බිමට නුඹ වැඩිවා මිසක දුවේ
වැදූ මවට නුඹ වැඩියක් වී ද දුවේ
දුක උහුලා ඉන්නට මට හැකිය දුවේ
නැව් නැඟිලා දුරු රටකට යන්න දුවේ

පෙර කළ මහ පින් මහිමෙනි
මේ දෙස උපදින්නේ
ඉපදෙනු මිස රැඳෙනා පින
ඇයි නුඹ සතු නො වුණේ
දරුවන් ඇස කඳුළින් ළය
උණු වන මිනිසුන්නේ
සරණින් ලොව කොතැනක වුව
සැනහෙන් දියණියනේ

මතු යම් දිනෙක සිතිවිල්ලෙන් සිටින සඳ
දෑතක පහස සිහිනෙන් මෙන් දැනේවි ද
සිතියම් පොතින් ලොව විමසා බලන සඳ
කඳුළක හැඩය මහ සයුරේ දකීවි ද

# මිතුරන් දෙදෙනා සහ පොරොව

- පරාක්‍රම කොඩිතුවක්කු -

ගෙදරින් පැන ඇවිත් ටික කලකට පස්සේ
දර වැඩ පළක එදවස කුලියට බැස්සේ
ඔබ හමු වුණා - විමලේ වාඩිය අස්සේ
තනිකම එදා නො දැනුණි මට ලණු මැස්සේ

එදා සිටන් තරගෙට අපි දර පැළුවා
වනන්තරේ ඉර-හඳ, දුක-සැප බැලුවා
කැලෑ කොළේ ගණනට දාඩිය හැළුවා
බැද්දේ කුරුල්ලන් නො නිඳා හඬ තැළුවා

හවසට වැඩ ඇරී අත් දෙක රිදුම දෙන
නාගෙන වතුර පොඩි වී නැති ගඟට පැන
රතු කොටු සරම වේළෙන තුරු එක ම තැන
බීඩිය උරමු දෙන්නා වෙන සැප ද මොන

උඩහ කැලෙන් පෙරළී ගෙන සුළඟ වැටෙයි
මහ රෑ වාඩියේ අපගේ නින්ද කොටයි
සමහර දාට එළිවන තුරු කතා විටයි
පොරෝ තලේ පිට සඳරැස් බින්දු නටයි!

මතක ද එදා දර පැළුවා පහළ කැලේ
වැටුණා පොරොව විසි වී ගඟ හැරෙන වළේ
මුදලාලිගේ බැණුමෙන් මා තැළෙන වෙලේ
පැන්නේ ඔබ යි කිමිදෙන්නට ගලන ජලේ

හදිස්සියෙන් ඔබ වතුරෙන් උඩ ආවා
අතකින් මුහුණ වහගෙන කෙඳිරිලි ගෑවා
'ගඟ යට උලක් නළලේ වැදුණා' කීවා
පීලි ගහන ලේ ඇසකින් විසි වූවා

දර ලොරියකින් හිස උකුළේ තියාගෙන
ආවා වීදියට රෝහල සොයාගෙන
මගෙ කොටු සරම රතු විය ලේ උරාගෙන
නුඹ නැඬුවේ කොහොම ද දුක දරාගෙන

මා වෙනුවෙන් එදා ගඟ පතුලේ කිමිද
ඔබ හිස ගසා ගත්තේ පොළොවේ කිම් ද?
විමලේ මමත් ඔබෙ දුක් දහරේ කිමිද
දිවි ඇති තුරා එමි ඔබ පසුපස සබඳ!

සිංහල
Love of Wisdom
ප්‍රකාශනයකි.